# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1834/37 - 2013 ඔක්තෝබර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/15/30/2010.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.10.25 දිනැති හා අංක 1729/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.10.18 වැනි දින දරන නියෝගයෙන්. එක් පාර්ශ්වයක් වශයෙන් මොරටුව, සෙන්ට් පීටර්ස් පාර, මෙල්හර්ට්ස්, අංක 16හි පදිංචි ඩී. කේ. විජේසේකර මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, අංක 545හි පිහිටි කේ. ජී. ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.09.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,  
කම්කරු කොමසාරිස්.

2013 ඔක්තෝබර් මස 24 වැනි දින,  
කම්කරු දෙපාර්තමේන්තුව,  
කොළඹ 05.

*කාර්මික අධිකරණයේ දී ය.*

*යොමු අංකය* : IR/15/30/2010.

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී. කේ. විජේසේකර මයා,  
අංක 16, මෙල්හර්ස්ට්,  
සෙන්ට් පීටර්ස් පාර,  
මොරටුව

නඩු අංකය : ඒ/3408

අනෙක් පාර්ශ්වය වශයෙන්,

කේ. ජී. ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්,  
අංක 545, ශ්‍රී සංඝරාජ මාවත,  
කොළඹ 10.

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2011.10.18 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශ්වය අතර පවතින කාර්මික ආරවුල මෙසේ ය.

"කේ. ජී. ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්හි සිවිල් ඉංජිනේරු සේවයට බැඳුණු ඩී. කේ. විජේසේකර මහතාට සේවා කාලය තුළ පත්වීම් ලිපිය මගින් ලබා දීමට එකඟ වූ Achivement/Report Allowance ලෙස දිනක රු. 200/- බැගින් හා ප්‍රවාහන දීමනාව ලෙස නිවසේ සිට කාර්යාලයට යාමට හා ඒමට කිලෝ මීටරයකට රු. 20/- බැගින් වූ දීමනාවෙන් ඉතිරි මුදල නොගෙවීම නිසාවෙන් ආසාධාරණයක් සිදු වීද, සිදු විණි නම් ඔහු වෙනුවෙන් ලැබිය යුතු සහනය කුමන ප්‍රමාණයක් ද '' යන්න පිළිබඳව වේ.

දෙපාර්ශ්වය සිය ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පළමු පාර්ශ්වය ඉල්ලුම්කරුව සාක්ෂියට කැඳවන ලදී. ඉල්ලුම්කරු


1A - G 18458 — 165 (2013/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව පළමු පාර්ශ්වය සිය නඩුව අවසන් කරන ලදී. ඉන් අනතුරුව දෙවන පාර්ශ්වය නඩුව ආරම්භ කරමින් කළමනාකර අධ්‍යක්ෂ ගුණරත්නම් රවින්ද්‍රනාත් පද්මරාජ් මහතා සාක්ෂියට කැඳවන ලදී. එම සාක්ෂිකරුගෙන් පළමු පාර්ශ්වය හරස් ප්‍රශ්න අසමින් සිටියදී දෙපාර්ශ්වය සමථයක් පිළිබඳව කටයුතු කරන බව දැනුම් දීම මත ඒ අනුව පියවර ගැනීමට දිනයක් ලබා දෙන ලදී. 2013.07.23 වැනි දින මෙම ආරාවුල බේරුම්කරණයට කැඳ වූ අවස්ථාවේ දී වගඋත්තරකරු ඉල්ලුම්කරුට සියළුම හිමිකම් වෙනුවෙන් රු. 1,00,000/-ක මුදලක් ගෙවීමට කැමති බව දැනුම් දෙන ලදී. ඉල්ලුම්කරුද එම මුදල ලබා ගෙන මෙම ආරාවුල සමථයකට පත් කිරීමට එකඟ විය. එකී සමථය පරිදි ලක්ෂයක (රු. 1,00,000) මුදල 2013.08.06 වැනි දින මා ඉදිරිපිටදී ගෙවන ලදී. ඉහත ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බව මම නිගමනය කරමි. ඒ අනුව මෙම ආරාවුල සමථයකට පත් කරමි.

පාලිත වීරසේකර,
(බේරුම්කරු).

2013 සැප්තැම්බර් මස 24 වැනි දින.

11-545

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.